ඒ ඒ පාඨමාලාවන්ට අදාළව ඉහළම දක්ෂතා දක්වන සිසුන් සඳහා (අධ්‍යයනාංශය හා පීඨය මගින් අනුමත කරන ලද) ත්‍යාග හා මුද්‍රිකා ප්‍රදානය කෙරේ.

11. විශ්වවිද්‍යාලයීය රෙගුලාසි හා ආචාර ධර්ම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ විස්තාරිත පාඨමාලා සඳහා ලියාපදිංචි සියලුම සිසුන් පහත සඳහන් නිර්ණායක අනුගමනය කළ යුතුය.

- ලියාපදිංචි වූ පාඨමාලාවේ දේශන සඳහා 80%ක පැමිණීම තිබිය යුතුය.
- විභාගවලට අදාළ කොන්දේසි උල්ලංඝණය කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර විභාග අක්‍රමිකතා වෙනුවෙන් නියම කරනු ලබන සියලුම නීති හා රෙගුලාසි සියලුම විස්තාරිත පාඨමාලා සඳහා ද වලංගුවේ.
- සියලුම සිසුන් විශ්වවිද්‍යාලය තුළ දී අදාළ ආචාරධර්ම අනුගමනය කළයුතුය.
- අඛණ්ඩ හා අවසන් ඇගයීම් සියල්ල සම්පූර්ණ කළ යුතුය.
- දේශනයේදී දැනුවත් කරන ලද නියමිත පූර්ව කියවීම් සම්පූර්ණ කළයුතුය.
- පිළිගත හැකි හේතුවක් නොදන්වා පංති කාමරයට ප්‍රමාදවී පැමිණීම හෝ දේශනය අතරතුර පිටවයෑම නොකළ යුතුය.
- දේශන, විභාග හෝ නිබන්ධන පංති පැවැත්වෙන අවස්ථාවලදී සෙසු සිසුන්ට, අධ්‍යයන කාර්යමණ්ඩලයට හෝ සහායක කාර්යමණ්ඩලයට බාධා කිරීම, අශිලාචාර ලෙස කථා කිරීම හෝ හැසිරීම නොකළ යුතුය.
- දේශන ශාලාවට පැමිණීමට පෙර සියලුම ශබ්ද නගන විද්‍යුත් උපකරණ අක්‍රීය කළයුතුය.
- අධ්‍යයන කටයුතුවලට අදාළ නොවන කිසිඳු ක්‍රියාකාරකමක් පංතිකාමරය තුළ නොකළ යුතුය.
- සිසුන්ට, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට කවරම ආකාරයකින් හෝ බලපෑම් කිරීම, තර්ජනය කිරීම හෝ හිරිහැර කිරීම කිසිසේත්ම නොකළ යුතුය.
- කිසිවෙකුගේ සමාජ තත්ත්වය, ජාතිය, වර්ගය, ලිඞ්ගිකත්වය, සමාජ පඬිතිය, ලිඞ්ගික භාවය, වයස, ආගම හා හැකියාවන් ආදිය පිළිබඳ වැරදි සහගත හෝ හිංසනික ලෙස ප්‍රකාශනය හා ක්‍රියාකිරීම කිසිසේත් නොකළ යුතුය.
- ශිෂ්‍යයින් විසින් ආචාර්යවරුන්ගේ දේශන හා සම්බන්ධ සාධාරණ හා ධනාත්මක සංවර්ධනය උදෙසා වන අදහස් ඉදිරිපත් කළ හැකිය.
- මිනිසුන්ගේ හැකියාවන් හා අත්දැකීම් කවරම ආකාරයකින් පහත් කොට සැලකීම හෝ අවතක්සේරු කිරීම නොකළ යුතුය.
- සමාජමය වශයෙන් පිළිනොගන්නා සහ කඩාකප්පල්කාරී ක්‍රියාවන් නොකළ යුතුය.
- ඉහත සඳහන් කවරම හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් ශිෂ්‍යයෙකු වරදකරු වුවහොත් ඔහු වෙත සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා සහතික පිරිනැමීමක් නොකෙරේ.

12. ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා විස්තර

12.1 ඇබ්බැහිවීම් පිළිබඳ මනෝවිද්‍යාව හා පුනුරුත්ථාපනය ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය: දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය
අරමුණු:

1. පුනරුත්ථාපනයට හා ඇබ්බැහිවීම් පිළිබඳ මනෝවිද්‍යාවට අදාළව මනෝවිද්‍යාව හදාරණ විද්‍යාර්ථීන් දැනුමෙන්, අගනාකම්වලින් හා කුසලතාවලින් සවිබල ගැන්වීම.
2. ගෝලීය සන්දර්භයක් තුළ ඇබ්බැහිවීම සම්බන්ධයෙන් පුනරුත්ථාපන ක්‍රියාවලියට ඇතුළත්වීමේ මට්ටම සඳහා දක්ෂ වෘත්තිකයින් සූදානම් කිරීම.

ඉගෙනුම් ඵල:

මෙම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කිරීම තුළින් සිසුන් හට,

1. මානසික ගැටලු හා අවශ්‍යතා හඳුනාගැනීම, පුද්ගලයන් පුනරුත්ථාපනයට අදාළ ඉලක්ක ස්ථාපිත කිරීම, අධීක්ෂණය හා උපදෙස් ලබාදීමේ භාවිතය හඳුනාගැනීම, ස්වයං දැනුවත්භාවය හා පුනරුත්ථාපනය පිළිබඳ මනෝවිද්‍යාවේ වෘත්තීමය ඉතිහාසය හා අගනාකම් පිළිබඳ ඇගයීම.
2. විවිධ මනෝචිකිත්සක ඖෂධ හා ඒවායේ ව්‍යුහයන්, බලපෑම් හා ක්‍රියාකාරීත්වය සන්සන්දනය කිරීම.
3. හානිදායක මත්ද්‍රව්‍යවල බලපෑම විග්‍රහ කිරීම හා ඇබ්බැහිවීම හා සම්බන්ධ චර්යාවන් පිළිබඳ ඇති න්‍යායන් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීම සහ මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම් වැලැක්වීම සඳහා වූ විවිධ ප්‍රවේශයන් හඳුනාගැනීම.
4. සෞඛ්‍ය ප්‍රවර්ධනය, ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා මනෝවිද්‍යාත්මක යහපැවැත්ම උදෙසා ප්‍රජාව සමග ගණුදෙණු කිරීම හා පුනරුත්ථාපන ක්ෂේත්‍රයට අදාළව පරිපාලන තීන්දු තීරණ ගැනීම, උපදෙස් ලබාදීම, නීතිමය කාර්යභාරයන්, අධීක්ෂණය, තීරණ ගැනීම, වගකීම් සහතික කිරීම.
5. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම හා වැලැක්වීම පිළිබඳ ජීව විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක හා සමාජ සංස්කෘතික මැදිහත්වීම පිළිබඳ ඇගයීමට හැකියාව ලැබේ.

මට්ටම

SLQF - මට්ටම 3

NVQF - මට්ටම 5

හැඳින්වීම

මත්පැන්වලට ඇබ්බැහිවීම හා අනෙකුත් මත්ද්‍රව්‍යවලට යොමු වීම 19 වන සියවසේ මුල් භාගයේ දී රෝගාබාධයක් වශයෙන් පැවතුණි. 1956 දී ඇමරිකානු වෛද්‍ය සංගමය විසින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම රෝගයක් වශයෙන් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම 1987 දී ඒ හා අනෙකුත් වෛද්‍ය සංගම් විසින් ඇබ්බැහිවීම රෝගයක් ලෙස නිල වශයෙන් හඳුන්වන ලදී. "ඇබ්බැහිවීම යනු මනෝභාවයන් වෙනස් කරවන ද්‍රව්‍යයන් එනම් මත්ද්‍රව්‍ය හෝ මත්පැන් හා ඒවායේ අහිතකර ප්‍රතිඵල පැවතුණ ද ඒවා නොසලකා දිගු කාලයක් භාවිතා කිරීමයි. ජානමය මනෝ සමාජීය හා පාරිසරික සාධක මෙම රෝගය පහල වීමට සහ සංවර්ධනය සඳහා බලපානු ලබයි. ඒ අනුව මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම දිගු කාලීන මත්ද්‍රව්‍ය භාවිතයේ අක්‍රමික ප්‍රතිඵලයක් ලෙසත්, එය සායනිකව සැලකිය යුතු පීඩාවන් ඇති කරන බවත් සඳහන් කරයි.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ තොරතුරු පිළිබඳ අත්පොත (2017) ට අනුව මත්ද්‍රව්‍ය හා සමගාමී සමස්ත අත්අඩංගුවට ගැනීම් 79,378 ක් ලෙස වාර්තා වී ඇත. 1980 මුල් භාගයේ සිටම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, ප්‍රධාන වශයෙන්ම තරුණ පරම්පරාව සම්බන්ධයෙන් හෙරොයින් ගැටලු රාශියකට මුහුණ පෑමට ශ්‍රී ලංකාවට සිදුවුණි. මේ අනුව ශ්‍රී ලංකාව තුළ හෙරොයින් භාවිතා කරන්නන් 45,000 ක් හා මර්ජුවානා භාවිතා කරන්නන් 200,000 ක් පමණ සිටින බවට ගණන් බලා ඇත. එමෙන්ම මත්පැන් හා දුම්වැටි භාවිතය ද සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත. එමෙන්ම තරුණ ප්‍රජාව තුළ මනෝ චිකිත්සක හා වෙනත් ඖෂධ භාවිතය ද සීඝ්‍ර ලෙස වැඩි වී ඇති බව අනාවරණය වී ඇත.

ලොව පුරා ඇති රටවල්වලට මෙම මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම ප්‍රධාන ගැටලුවක් මෙන්ම තර්ජනයක් බවට ද පත් වී ඇත. ඇබ්බැහිවීම් පිළිබඳ මනෝවිද්‍යාව සායනික මනෝවිද්‍යාව හා අසාමාන්‍ය මනෝවිද්‍යාව යන අංශවලින් සමන්විත වන අතර විවිධ පර්යේෂණවලින් ලබාගත් දැනුම විවිධ වූ ඇබ්බැහිවීම්වලට ලක් වූ පුද්ගලයන්ගේ රෝග විනිශ්චය, ඇගයීමට ලක් කිරීම, ප්‍රතිකාර කිරීම හා ඔවුන්ට අවශ්‍ය සහය ලබාදීමට උපයෝගී කරගනී. ප්‍රතිකාර ක්‍රියාවලිය තුළ දී ඇබ්බැහිවීම් පිළිබඳ මනෝවිද්‍යාඥයින් කායික, මානසික හා චිත්තවේගී ගැටලුවලට මුහුණ දීමට අවශ්‍ය හැසිරීම් ප්‍රවර්ධනය කරනු ලබයි.

වෙනත් ආකාරයට පවසන්නේ නම්, මත්ද්‍රව්‍ය සඳහා නිරාවරණය වූ පුද්ගලයෙකු එය භාවිතයේ දී ලැබෙන ජයග්‍රාහී හැඟීම නොකඩවා ලබා ගැනීමට යාමේ දී එම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි විය හැකි ය. ඇබ්බැහිවීම් සඳහා ලබාදෙන මනෝ උපදේශනය සාමාන්‍යයෙන් වරලත් වෘත්තිකයෙකු විසින් කාර්යාලයක හෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක දී සිදු කරනු ලබයි. ඇබ්බැහිවීම් පිළිබඳ මනෝ උපදේශනය තුළින් පුද්ගලයාට දරා ගැනීමේ හැකියාව සහ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම හෝ නැවැත්වීමට අදාළ වෘත්තිමය උපදෙස් ලබාදෙන අතර පුද්ගලයාට මත්ද්‍රව්‍ය දිගින් දිගටම ලබා ගැනීමෙන් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. ඇබ්බැහිවීම් පිළිබඳ මනෝ උපදේශනය අංග කිහිපයකින් සමන්විත වේ. එනම් බඳවා ගැනීම හා ඇගයීම, ප්‍රතිකාර සැලසුමක් නිර්මාණය කිරීම, විවිධ මනෝ චිකිත්සක ප්‍රතිකාර ක්‍රම ක්‍රියාවට නැංවීම හා අඛණ්ඩව සත්කාර කිරීම (රැකබලා ගැනීම). උපදේශකවරුන්ට ඔවුන්ගේ ශාස්ත්‍රීය හා වෘත්තීමය පුහුණුව නිසාම වඩා ඵලදායී ලෙස මෙම අංශ ක්‍රියාවට නැංවිය හැක.

පුනරුත්ථාපනය යනු විවිධ ආබාධ හා නිධන්ගත රෝගවලින් පෙළෙන පුද්ගලයින් සඳහා සාමාජීය වශයෙන් අර්ථවත්, පුද්ගලික වශයෙන් සෑහීමකට පත්විය හැකි හා ඵලදායී ලෙස අන්තර් ක්‍රියාවන්හි යෙදීමට හැකි ආකාරයෙන් මැදිහත්වීම සඳහා ගොඩ නැගුණු වැඩසටහනකි. පුනරුත්ථාපන මනෝවිද්‍යාව යනු මනෝවිද්‍යාත්මක ඥානය හා කුසලතා විවිධ වූ ආබාධ හා නිධන්ගත ආබාධ වලින් පෙළන පුද්ගලයින්ගේ සෞඛ්‍ය තත්ත්වය හා සුබසාධනය ඉහළ නැංවීමටත්, සුභසාධනය වැඩි දියුණු කිරීමටත්, සමාජය තුළ ජීවිත කාලය පුරාවට ක්‍රියාකාරීව හැසිරීම සඳහා උපකාර කිරීමටත් යොදා ගැනීමයි. දරුණු ගණයේ සෞඛ්‍ය තත්ත්වයන් හා ආබාධ ඇති පුද්ගලයින්ට අදාළව නෛතික හා රාජ්‍ය ප්‍රතිපත්ති සංවර්ධනය, පරිපාලනය, පුහුණු කිරීම, ඉගැන්වීම හා අධ්‍යාපනය, සේවා සැපයීම, පර්යේෂණ සිදු කිරීම, වැඩසටහන් සංවර්ධනය හා උපදෙස් ලබාදීම වැනි කටයුතු සඳහා ඇබ්බැහිවීම් පිළිබඳ මනෝවිද්‍යාඥයින් විශේෂඥ හා සුවිශේෂී වූ පුහුණුවකින් යුක්ත වේ. සමාජය තුළ දිනෙන් දින ඉහළ යන මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් මෙම පුනරුත්ථාපනය පිළිබඳ වැදගත්කම ශ්‍රී ලංකාව තුළ ස්මතු වී ඇත. රටතුළ මෙම ව්‍යසනය විශාල ගැටලුවක් ලෙස පවතින නිසාම මෙම ඩිප්ලෝමා පාඨමාලාව තුළින් සිසුන් හට මත්ද්‍රව්‍ය ආශ්‍රිත උපදේශන ක්‍රමවේද හා මැදිහත්වීමේ ක්‍රියාවලීන් පිළිබඳ අවබෝධයක් ලබා දීම මුඛ්‍ය අරමුණ වී ඇත. මෙය වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා අදාළ වේ. මේ අනුව බලන කල ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ඇබ්බැහිවීම් පිළිබඳ මනෝවිද්‍යාව හා පුනරුත්ථාපන මනෝවිද්‍යාව පිළිබඳ දැනුම කෙරෙහි සුවිශාල අවශ්‍යතාවක් පවතින බව පෙනී යයි.

පාඨමාලා ව්‍යුහය

විෂය කේතය	විෂයේ නම	දේශන පැය	අධ්‍යයන පැය	අගය
DAPR 1110	ඇබ්බැහිවීම පිළිබඳ මනෝවිද්‍යාව හැඳින්වීම	45	150	3
DAPR 1120	අසාමාන්‍ය චර්යා	45	150	3
DAPR 1130	මනෝවිද්‍යාත්මක ඇගයුම් හා තක්සේරු	45	150	3
DAPR 1140	පුනරුත්තාපනය (සමාජ පුනරුත්තාපනය)	45	150	3
DAPR 1150	ඇබ්බැහිවීම සඳහා නැවැත යොමුවීම වැළැක්වීම	45	150	3
	එකතුව	225	750	15

12.2 බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය : පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය
අරමුණු :

1. උපදේශනයට අදාළ බෞද්ධ ඉගැන්වීම් ඉගැන්වීම හා පුහුණු කිරීම.
2. බෞද්ධ උපදේශන ක්‍රමවේදයන් හි ගැඹුර සහ කාලෝචිත අදාළත්වය වැඩි දියුණු කිරීම.
3. බෞද්ධ උපදේශන ක්‍රම මගින් නවීන උපදේශන පිළිවෙත් වැඩි දියුණු කිරීම.

ඉගෙනුම් ඵල

මෙම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කිරීම තුළින් සිසුන් හට,
1. උපදේශනයට අදාළ බෞද්ධ ඉගැන්වීම්වල මූලධර්ම පිළිබඳ දැනුම හඳුනා ගැනීම.
2. බෞද්ධ උපදේශන ක්‍රම හඳුනා ගන්නා නිර්මාණාත්මක හා තාර්කික චින්තකයින් බිහි කිරීම.
3. නූතන උපදේශන මූලධර්ම බෞද්ධ උපදේශන ක්‍රම සමඟ එක් කොට එහි ප්‍රායෝගික වටිනාකම හා අදාළත්වය විශ්ලේෂණය කර සංසන්දනය කිරීම.
4. මුල් පාලි සාහිත්‍යයේ ඇති උපදේශන අගයන් අර්ථ නිරූපණය කිරීම.
5. ගෝලීය සන්දර්භය තුළ මානසික හා සමාජීය ගැටලු විසඳීම සඳහා යොදා ගත හැකි බෞද්ධ උපදේශන ක්‍රම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තක්සේරු කිරීම.

මට්ටම

SLQF - මට්ටම 3

NVQF - මට්ටම 5

හැඳින්වීම

බුදුදහම දර්ශනයකි. නමුත් ආගමක් නොවේ. බුදුදහමේ හරය වඩා සමීප වන්නේ මනෝ විද්‍යාවටයි. මෑත කාලීනව ධනාත්මක මනෝවිද්‍යාව මතුවීමත් සමඟ වැඩි වැඩියෙන් ඇමරිකානු සහ යුරෝපීය පර්යේෂකයන් විශේෂයෙන් සතිය පුහුණු කිරීම සම්බන්ධයෙන් සහ බෞද්ධ මනෝ විද්‍යාව හැදෑරීම කෙරෙහි අවධානය යොමු කිරීම කොට ඇත. එබැවින් මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ මූලික බෞද්ධ ඉගැන්වීම්, මානසික රෝග සහ ගැටලු සහගත හැසිරීම් විශ්ලේෂණය, උපදේශන අරමුණු සඳහා මූලික බෞද්ධ ඉගැන්වීම්වල අදාළත්වය, බටහිර චිකිත්සක න්‍යායන් සහ බෞද්ධ උපදේශනයේ ප්‍රවේශයන්, බෞද්ධ භාවනාව සහ නූතන මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් සහ මනෝචිකිත්සක ක්‍රම දේශීය ආගමික හා සංස්කෘතික සාරධර්ම සමග මුසුකොට දේශීය සංස්කෘතියට වඩාත් සමීප වූ බෞද්ධ උපදේශන ක්‍රමයක් හඳුන්වාදීමයි.

බෞද්ධ උපදේශනය ඩිප්ලෝමාව බෞද්ධ අධ්‍යයන හා මානව මනසෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම කෙනෙකුට අධ්‍යයනය කළ හැකිය. පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය මගින් මෙම පාඨමාලාව සඳහා බටහිර උපදේශන න්‍යාය හා භාවිතයන් පිළිබඳ සහ බෞද්ධ උපදේශනයේ ප්‍රවේශයන් ඇතුළත් කර විධිමත් ලෙස සකසා ඇත.

පාඨමාලා ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
I සමාසිකය				
DAPR 1110	බෞද්ධ මනෝවිද්‍යාව පිළිබඳ මූලික හැඳින්වීම	45	150	3
DAPR 1120	චිත්තවේග (බටහිර හා බෞද්ධ)	45	150	3
DAPR 1130	බුදු දහම හා පෞරුෂ සංවර්ධනය	45	150	3
DAPR 1140	බෞද්ධ උපදේශනය හා මනෝවිද්‍යාව	45	150	3
DAPR 1150	බෞද්ධ භාවනා හා චරිත සංවර්ධනය	45	150	3
DAPR 1160	බුදු දහම සහ මානසික ගැටලු	45	150	3
II සමාසිකය				
DAPR 1210	සෞන්දර්ය හා බෞද්ධ උපදේශනය	45	150	3
DAPR 1220	සමාජ ගැටලු සඳහා බෞද්ධ උපදේශනය	45	150	3
DAPR 1230	බෞද්ධ මනෝ චිකිත්සාව	45	150	3
DAPR 1240	විස්තාරික නිබන්ධය	45	150	3
	එකතුව	450	1500	30

12.3 බෞද්ධ පූර්ව ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය : පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය
අරමුණු:

1 බුදුදහම හා බෞද්ධ සංස්කෘතිය සමඟ සම්බන්ධ වන විධිමත් අධ්‍යාපන ක්‍රමයක් හඳුනා ගන්නා නිර්මාණාත්මක හා තාර්කික චින්තකයින් බිහි කිරීම.
2. දරුවන්ගේ මානසික හා ශාරීරික යහපැවැත්ම වැඩිදියුණු කළ හැකි වෘත්තිකයන් බිහි කිරීම.
3. බෞද්ධ ඉගැන්වීම් මගින් මානුෂීය ගුණාංග දරුවන් සමඟ බෙදාගන්නා වෘත්තිකයින් සවිබල ගැන්වීම

ඉගෙනුම් ඵල

මෙම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් සිසුන් හට,
1. පෙර පාසල් පද්ධතිවල සමාජ සංස්කෘතික හා සදාචාරාත්මක කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පෙර පාසල් අධ්‍යාපනයේ සහ බෞද්ධ අධ්‍යාපන මූලධර්ම හඳුනා ගැනීම.
2. සමාජ සබඳතා විශ්ලේෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ඵලදායී සන්නිවේදන කුසලතා ඇති කිරීම.
3. නවීන අධ්‍යාපන මූලධර්ම සමඟ මුල් ළමාවිය සංවර්ධන මූලධර්ම ඇගයීම සහ තේරුම් ගැනීම.
4. වඩාත් ධනාත්මකව හා ක්‍රියාශීලීව ප්‍රජා ක්‍රියාකාරකම්වල නිරත විය හැකි වෘත්තිකයින් බිහි කිරීම.

මට්ටම

SLQF - මට්ටම 3

NVQF - මට්ටම 5

හැඳින්වීම

පූර්ව ළමාවිය අධ්‍යාපනය ළමාවිය සංවර්ධනයේ අඩිතාලම ලෙස සැලකිය හැකිය. පෙර පාසලට ඇතුළත් වීමට පෙර දරුවන් වැඩිහිටියන් සමඟ වාචික හා වාචික නොවන සන්නිවේදනය තුළින් අවිධිමත් අධ්‍යාපනය ලබා ගනී. කෙසේ වෙතත්, වර්තමාන විධිමත් පෙර පාසල් පද්ධතිය දරුවන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා සතුටුදායක මට්ටමක නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, අපි දරුවන් හතර දෙනෙකු විවිධ පෙර පාසල් හතරකට යවන්නේ නම්, එම දරුවන්ගේ ඉගෙනීමේ සහ කුසලතා එකිනෙකට වෙනස් වේ. ඉගැන්වීමේ අත්දැකීම් නොමැතිකම සහ පෙර පාසල් ගුරුවරුන්ගේ නුසුදුසුකම, කෘතිම පරිසරය, විදේශීය සංස්කෘතිය හා සම්බන්ධ ඉගැන්වීමේ ක්‍රම, දරුවන්ගේ කුසලතා තේරුම් ගැනීමට නොහැකි වීම, නිසි විෂය නිර්දේශයක් නොමැතිකම වර්තමාන මුල් ළමාවිය අධ්‍යාපනයේ ප්‍රධාන ගැටලු කිහිපයක් ලෙස සැලකිය හැකිය.

මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන ක්‍රමය නඟා සිටුවීම සඳහා අධ්‍යාපනය පිළිබඳ සාම්ප්‍රදායික බෞද්ධ ඉගැන්වීම් කෙරෙහි අවධානය යොමු කරයි. මෙම පාඨමාලාවේ සමස්ත පරමාර්ථය වනුයේ බෞද්ධ අධ්‍යාපනය පදනම් කරගත් වඩා හොඳ විධිමත් පෙර පාසල් පද්ධතියක් හඳුන්වා දීමයි.

පාඨමාලා ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
I සමාසිකය				
DAPR 1110	ළමා අධ්‍යාපන මූලධර්ම	45	150	3
DAPR 1120	පෙර අපරදිග ළමා මනෝ විද්‍යාව	45	150	3
DAPR 1130	පූර්ව ළමා අධ්‍යාපනය, පරිපාලනය හා සංවිධානය	45	150	3
DAPR 1140	ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා පූර්ව ළමා අධ්‍යාපනය	45	150	3
DAPR 1150	බෞද්ධ ළමා සාහිත්‍යය	45	150	3
DAPR 1160	භාෂා පුහුණුව	45	150	3
II සමාසිකය				
DAPR 1210	බුදු දහම හා ළමා පෞරුෂත්ව සංවර්ධනය	45	150	3
DAPR 1220	බෞද්ධ සිරිත් විරිත් හා ළමා අධ්‍යාපනය	45	150	3
DAPR 1230	සෞන්දර්ය හා බෞද්ධ අධ්‍යාපනය	45	150	3
DAPR 1990	විස්තාරිත නිබන්ධනය	45	150	3
	එකතුව	450	1500	30

12.4 බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය: පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
අරමුණු:

බෞද්ධ දර්ශනයේ ආරම්භය හා විකාශය සහ එහි සමාජ භාවිතය ඓතිහාසිකවත් ප්‍රායෝගිකවත් හඳුන්වාදීම. බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයෙහි මූලික සංකල්ප හඳුන්වාදීම. බෞද්ධ ඉගැන්වීම්වල ප්‍රායෝගික අගය වටහා දී ජීවිත පරිඥානයක් ඇතිකරලීම හා භාවනාව තුළින් මානසික සමතුලිතබව ඇතිකරලීම.

ඉගෙනුම් ඵල:

මෙම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කිරීම තුළින් සිසුන් හට,

1. බුදුදහමේ මූලාරම්භය හා ව්‍යාපෘතිය පිළිබඳ දැනුම හඳුන්වා දීම.
2. බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයෙහි මූලික සංකල්ප හඳුන්වාදීම.
3. වර්තමාන සමාජය වෙන වෙනම හඳුනා ගන්නා නිර්මාණාත්මක හා තාර්කික චින්තකයින් බිහිකිරීම
4. සමාජ සම්බන්ධතා ප්‍රායෝගිකව භාවිතා කිරීමට බෞද්ධ ඉගැන්වීම් ඵලදායීව උපයෝගිකරගැනීම.
5. සමාජ ආකල්ප අවබෝධ කරගැනීමට පුද්ගල ප්‍රායෝගික බුද්ධිමට්ටම් වර්ධනය කිරීම.
6. සාර්ථක, ඵලදායී හා විද්වත් මට්ටමෙන් බුදුදහමේ එන මතවාදයන් පුද්ගලයන් හා කණ්ඩායම් අතර සන්නිවේදනය කිරීම.
7. ධනාත්මකව සිතමින් ක්‍රියාශීලිව බෞද්ධ ඉගැන්වීම් සමාජයේ භාවිත කිරීම.

මට්ටම

SLQF - මට්ටම 3

NVQ - මට්ටම 5

හැඳින්වීම

බුදුදහමේ මූලික ඉගැන්වීම් අධ්‍යයනය කිරීම සහ බෞද්ධ භාවනා ක්‍රම ප්‍රායෝගිකව භාවිත කිරීම රටේ ප්‍රධාන ප්‍රවණතාවක් බවට පත්ව ඇත. කෙසේ වෙතත් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අවස්ථාව නොලැබූවන්ට අතිරේක අවස්ථාවක් ලබාදීම සඳහා නිසි වැඩසටහනක් මෙම ක්‍රමයේ නොතිබුණ නිසා බුද්ධ ධර්මය, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ භාවනාව යන මූලික ඉගැන්වීම් මත පදනම්ව මෙම බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමාව නිර්මාණය වී ඇත. ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක් විසින් මෙහෙය වන මෙම ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම තුළින් තම ඉලක්ක සපුරා ගෙන ඉහළ ශ්‍රේණි ගත සහතික පත්‍රයක් ලබාගත හැකිය.

බුදුදහමේ දැනුම පදනම් වී ඇත්තේ බුදුදහමේ එන මූලික ඉගැන්වීම් හා බෞද්ධ සංස්කෘතිය ආශ්‍රයෙනි. මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රධාන අරමුණ බුදුදහමේ මූලික සංකල්ප ඉගැන්වීමයි. වෘත්තීයමය වශයෙන් කටයුතු කිරීමට අදහස් කරන රජයේ ආයතනවල හෝ වෙනත් ආයතනවල ගුරුවරුන්, පාසල් හැරගිය අය, බුදු දහම කෙරෙහි උනන්දුවක් දක්වන සියලු දෙනාට මෙම ඩිප්ලෝමා වැඩසටහන හැදෑරීම තුළින් විශේෂ වටිනාකමක් ලබාගත හැකිය.

පාඨමාලාවේ ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
පළමු අර්ධ වාර්ෂිකය				
DPBS 0001	බුදුදහමේ මූලික ඉගැන්වීම් - I	45	150	3
DPBS 0002	බෞද්ධ සමාජ දර්ශනය - I	45	150	3
DPBS 0003	බුදුදහම හා උපදේශනය - I	45	150	3
DPBS 0004	බුදුදහම හා භාවනාව - I	45	150	3
DPBS 0005	සමාජ ගැටලු විෂයෙහි බෞද්ධ විසඳුම්	45	150	3
දෙවන අර්ධ වාර්ෂිකය				
DPBS 0006	බුදුදහමේ මූලික ඉගැන්වීම් - II	45	150	3
DPBS 0007	බෞද්ධ සමාජ දර්ශනය - II	45	150	3
DPBS 0008	බුදුදහම හා උපදේශනය - II	45	150	3
DPBS 0009	බුදුදහම හා භාවනාව - II	45	150	3
DPBS 0010	විස්තාරිත රචනය	45	150	3
	එකතුව	450	1500	30

12.5 චීන භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය: පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
අරමුණු:

1. චීන භාෂාව විදේශීය භාෂාවක් ලෙස ඉගැන්වීම.
2. ප්‍රායෝගික සන්නිවේදනය සඳහා භාෂාව ඵලදායී ලෙස ලිවීමේ හැකියාව වර්ධනය කිරීම.
3. භාෂාව ප්‍රගුණ කිරීමේ කුසලතා, සවන්දීම, කථා කිරීම, කියවීම සහ විශේෂයෙන් ලිවීම සහ චීන සංස්කෘතිය හා ශිෂ්ටාචාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම.

ඉගෙනුම් ඵල:

මෙම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කිරීම තුළින් සිසුන් හට,
1. චීන භාෂාවේ මූලධර්ම පිළිබඳ දැනුම හඳුනා ගැනීමට හැකි වීම.
2. චීන භාෂා ක්‍රමය හඳුනා ගැනීමට හැකි වීම.
3. සමාජ සම්බන්ධතා විශ්ලේෂණය සහ කළමනාකරණය කිරීම සඳහා ඵලදායී සන්නිවේදන කුසලතා නිරූපණය කිරීමට හැකි වීම.
4. චීන භාෂා අධ්‍යාපන මූලධර්ම නවීන අධ්‍යාපන මූලධර්ම සමඟ යෙදවීමට හැකි වීම.

මට්ටම

SLQF - මට්ටම 3

NVQ - මට්ටම 5

හැඳින්වීම

ලෝකයේ විශාලතම ජනගහනය හිමි වන රට චීනය වන අතර ලෝකයේ බොහෝ රටවල භාෂා අතර චීන භාෂාවට ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. චීනය හැරුණු විට, මේ දිනවල බොහෝ රටවල චීන භාෂාව භාවිතා වේ. සංඛ්‍යාලේඛන අනුව චීන ආර්ථිකය දෙවන ස්ථානයට පත්ව ඇතත්, එය වර්තමානයේ ලෝකයේ විශාලතම ආර්ථිකය බව ප්‍රකට දෙයකි. තවද, චීන සංස්කෘතිය බොහෝ පැතිවලින් සුවිශේෂ වන අතර එය ලෝකයේ වෙනත් සංස්කෘතියකට සැසඳිය නොහැක. චීන භාෂාව මුළුමනින්ම සංකේත මත පදනම් වී ඇති බැවින්, එය සංස්කෘතියේම ශාඛාවක් ලෙස නොව, එය තුළ සංස්කෘතියක් ඇති භාෂාවක් ලෙස සැලකිය හැකිය.

චීනයේ පවතින බලගතු ආර්ථිකය වේගයෙන් ව්‍යාප්ත වන නිසා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන්ට චීන භාෂාව ඉගෙන ගැනීමට අවස්ථාවක් ලබා දීම අත්‍යවශ්‍ය වේ. තවද, ආර්ථික හා සංචාරක අරමුණු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන චීන ජාතිකයින්ගේ සංඛ්‍යාව වැඩි වෙමින් පවතින අතර වඩාත් වැදගත් දෙය වනුයේ වර්තමානයේ ශ්‍රී ලංකාවේ සිසුන්ට වෛද්‍ය, කළමනාකරණ අධ්‍යයන, විද්‍යා, කලා, සමාජ යන පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා චීන ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ. එහිදී උපාධිධාරීන්ට පශ්චාත් උපාධි අධ්‍යයනවලට පෙර චීන භාෂාව හැදෑරීම අනිවාර්ය වේ.

පාඨමාලා ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
පළමු අර්ධ වාර්ෂිකය				
DCLA 1110	චීන ව්‍යාකරණ	45	150	3
DCLA 1120	චීන අක්ෂර ලිවීම	45	150	3
DCLA 1130	චීන සවන්දීම	45	150	3
DCLA 1140	චීන කතා කිරීම	45	150	3
DCLA 1150	චීන කියවීම	45	150	3
දෙවන අර්ධ වාර්ෂිකය				
DCLA 1210	චීන ව්‍යාකරණ	45	150	3
DCLA 1220	චීන අක්ෂර ලිවීම	45	150	3
DCLA 1230	චීන සවන්දීම	45	150	3
DCLA 1240	චීන කතා කිරීම	45	150	3
DCLA 1250	චීන කියවීම	45	150	3
	එකතුව	450	1500	30

12.6 අපරාධ විද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය - අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය
අරමුණු:

1 ශ්‍රී ලංකාවේ අපරාධ ක්ෂේත්‍රයන් සම්බන්ධ නිපුණතාවයක් සිසුන්ට ලබා දීම, අපරාධ විද්‍යාවට අදාළ න්‍යායන්, අපරාධ විද්‍යාවට අදාළ පර්යේෂණ ක්‍රම, අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය සහ අනෙකුත් සමාජ ව්‍යුහයන්, ආයතන හා සංස්කෘතිය, අපරාධ යුක්තියේ පරාසය ප්‍රතිපත්ති, ඒවායේ සඵලදායීතාව, සීමාවන් සහ අපරාධ විද්‍යාත්මක සංකල්ප සහ ඒවායේ යෙදීම් සම්බන්ධයෙන් කාර්යක්ෂම හා ඵලදායී සන්නිවේදනයක් ගොඩනැගීම.

2 අපරාධ යුක්තිය, නීතිය ක්‍රියාත්මක කිරීම, නීතිය විනිශ්චය කිරීම, නිවැරදි කිරීම්, අපරාධ විද්‍යාත්මක න්‍යාය, පර්යේෂණ සහ විශ්ලේෂණ ක්‍රම යන අංශවල නිපුණතාවක් සිසුන්ට ලබා දීම.

3 ක්ෂේත්‍රයේ වර්තමාන තාක්ෂණය පිළිබඳව සිසුන්ට අධ්‍යාපනය ලබා දීම සහ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තර්කනයේ පසුබිමක් සිසුන්ට ලබා දීම.

4 අපරාධ යුක්තියේ විවිධ කරුණු විභාග කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.

ඉගෙනුම් ඵල:

අපරාධවිද්‍යා පාඨමාලාව සාර්ථකව නිමකිරීමෙන් පසු සිසුන්ට,

1 අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ හරය වන, ඉතිහාසය, ක්‍රියාවලි, සංරචක සහ සුභාවිතයන් (best practices) පැහැදිලි කිරීමට (එනම්, පොලිස්, අධිකරණ, විශෝධන ආයතන).

2 අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ පවතින ආචාර ධර්මයන්හි විවිධත්වය, සංස්කෘතිය, දේශපාලන බලය සහ ආයතනික බලය පිළිබඳ කාර්යභාරය විශ්ලේෂණය කිරීමට,

3 අපරාධවල ස්වභාවය, ප්‍රමාණය, හේතුව සහ වැළැක්වීම සහ ප්‍රධාන අපරාධ න්‍යායන් විවේචනය කිරීමට

4 සමාජීය විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් පවතින අපරාධ පාලනය හා නිවාරණයට කාලීන යෝජනා ඉදිරිපත් කිරීමට අවශ්‍ය දත්ත විශ්ලේෂණය කිරීමට
සහ

5 අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සහ එහි ක්‍රියාකාරීන් නියාමනය කිරීම සහ මෙහෙයවීම සඳහා සාර්ථක, ක්‍රියා පටිපාටි සහ අපරාධ නීතිවල මූලධර්ම අනුගමනය කිරීම සහ පන්ති කාමර පදනම් කරගත් තොරතුරු සැබෑ ලෝක සැකසුමකට අදාළ කිරීම (උදා: විවිධ සමාජ සේවා ආයතන, පොලිස් දෙපාර්තමේන්තුව, උසාවිය, විශෝධන ආයතන) සහ එම සැකසුමෙහි භාවිතයන්, ප්‍රතිපත්ති හෝ ක්‍රියාවලීන් විවේචනාත්මකව පරීක්ෂා කිරීමට, හැකියාව ලැබෙනු ඇත.

මට්ටම

SLQF - මට්ටම 3

NVQ - මට්ටම 5

හැඳින්වීම

අපරාධ විද්‍යාව පිළිබඳ හැඳින්වීම අපරාධ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ මූලික අංග පිළිබඳව සැලකිලිමත් වේ. මෙමඟින් ක්ෂේත්‍රයේ වඩා උසස් පාඨමාලා සඳහා පියවර කිහිපයක් මෙන්ම උනන්දුවක් දක්වන සිසුන්ට සාමාන්‍ය දළ විශ්ලේෂණයක් ලබා දේ. මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තරව අපරාධ මානයන්

සහ ප්‍රවණතා පිළිබඳ චිත්‍රයක් සැපයීම සඳහා පුළුල් පරාසයක සිද්ධි අධ්‍යයන මෙන්ම විවිධ වර්ගයේ සංඛ්‍යානමය ප්‍රභවයන් ද යොදා ගන්නා අතර අපරාධ යුක්තිය සහ වැළැක්වීම යන අංශවල නිර්වචනය හා මිනුම්, අපරාධ සිදුවීමේ න්‍යායන් සහ අපරාධවලට ප්‍රතිචාර දැක්වීම ද එය හඳුන්වා දෙයි.

මෙම පාඨමාලාව අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ප්‍රධාන උප පද්ධති තුනක් වන නීතිය බලාත්මක කිරීම, අධිකරණය සහ විශෝධනය පිළිබඳව ගවේෂණය කරන අතර මෙම ප්‍රධාන උප පද්ධති තුනේ ඉතිහාසය, දර්ශනය, ව්‍යුහය, වර්තමාන ගැටලු සහ අනාගත ප්‍රවණතා සම්මිශ්‍රිත ඉගෙනුම් ප්‍රවේශයක් භාවිතා කරමින් සාකච්ඡා කරනු ලැබේ. මෙම පාඨමාලාව මගින් ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ සහ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිවල කාර්යයන් සහ අධිකරණ බලය සහ ශ්‍රී ලංකා අපරාධ නීතියේ පදනම වන ප්‍රභවයන් සහ නීතිමය මූලධර්ම ද හඳුනා ගනිමින් විවිධ විශ්වාසයන්, සමාජ පීඩන, සදාචාරාත්මක ගැටලු, ආචාරධර්මානුකූල තීරණ ගැනීම සහ තීරණවල ප්‍රතිවිපාක සාකච්ඡා කරනු ලැබේ. මෙම පාඨමාලාව අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට සහාය වන ප්‍රජාවන්හි ඇති සම්පත් හඳුනාගන්නා අතර ලිඛිත නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සඳහා ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ද ආවරණය කරනු ලැබේ.

පාඨමාලාවේ ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
පළමු අර්ධ වාර්ෂිකය				
DCRM 1110	අපරාධවිද්‍යාවේ මූලික සංකල්ප හා න්‍යායන්	45	150	3
DCRM 1120	අපරාධ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම	45	150	3
DCRM 1130	පොලීසිය හා ප්‍රජාව	45	150	3
DCRM 1140	අපරාධ නීතිය හා අධිකරණ ක්‍රියාවලිය	45	150	3
දෙවන අර්ධ වාර්ෂිකය				
DCRM 1210	අපරාධ පාලනය හා නිවාරණය	45	150	3
DCRM 1220	දඬුවම හා පුනුරුත්තාපනය	45	150	3
DCRM 1230	අපරාධ විමර්ශනය හා අධිකරණ විද්‍යාව	45	150	3
DCRM 1240	පරිගණක අපරාධ/අධි තාක්ෂණ අපරාධ	45	150	3
DCRM 1250	ගැටුම් නිරාකරණය හා මැදිහත්කරණය	45	150	3
DCRM 1260	ස්වාධීන පර්යේෂණය			
	එකතුව	450	1500	30

12.7 සංවර්ධන ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව

පිරිනමන අධ්‍යයනාංශය - ආර්ථික විද්‍යාව අධ්‍යයනාංශය
අරමුණ:

මෙම පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ, සමකාලීන ප්‍රතිපත්තිමය කරුණු විශ්ලේෂණය කිරීම සඳහා න්‍යාය සහ සාක්ෂි භාවිතා කළ හැකි ආකාරය ගවේෂණය කිරීමට අවස්ථාව ලබා දීමයි.

ඉගෙනුම් ඵල:

මෙම පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු සිසුන්ට,

1. සංවර්ධන උපාය මාර්ග සහ භාවිතයන් පිළිබඳ දැනුම හා අවබෝධය නිරූපණය කිරීම.
2. විශ්ලේෂණාත්මක හා විවේචනාත්මක කුසලතා පරාසයක් භාවිතා කරමින් සමාජයට ධනාත්මක දායකත්වයක් ලබා දීම උදෙසා පුද්ගලික වගවීම නිරූපණය කිරීම.
3. දේශීය හා කලාපීය ආර්ථික සංවර්ධන සන්දර්භයන්හි තීරණවලට අදාළ සමාජ, සදාචාරාත්මක, පාරිසරික හා තිරසාර මානයන් සලකා බැලීමේ හැකියාව පෙන්නුම් කිරීම.
4. විවේචනාත්මක චින්තනය, ප්‍රතිපත්ති විශ්ලේෂණ කුසලතා සහ ගැටලු විසඳීමේ උපාය මාර්ග නිරූපණය කිරීම සහ සංවර්ධන ප්‍රතිපත්ති හා භාවිතයන් ඇගයීමට ලක් කිරීම.
5. සංවර්ධන උපාය මාර්ග භාවිතා කිරීමේදී රටට අදාළ විශ්ලේෂණාත්මක, විවේචනාත්මක චින්තනය සහ ගැටලු විසඳීමේ කුසලතා නිරූපණය කිරීම සහ ප්‍රතිපත්ති හා භාවිතයන් සම්බන්ධ කිරීමට හැකියාව ලබා දීම.

මට්ටම

SLQF - මට්ටම 3

NVQ - මට්ටම 5

හැඳින්වීම

ශ්‍රී ලංකාව, සෑම වසරකම ඉහළ වර්ධන වේගයක් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන බැවින් සංවර්ධන ප්‍රතිපත්ති විශ්ලේෂණය ශ්‍රී ලංකාවට ඉතා වැදගත් ය. කෙසේ වෙතත්, පශ්චාත් ස්වාධීන කාලය තුළ රටේ වර්ධන වේගය සහ සමස්ත සංවර්ධනය සතුටුදායක වී නොමැති හෙයින් සංවර්ධන ප්‍රතිපත්තිය කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස පුහුණු කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. මෙම ඩිප්ලෝමා පාඨමාලාව මෙම ඉලක්කය සපුරා ගනු ලබන්නේ පුළුල් විශ්ලේෂණ ක්‍රමවේදයන්, ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ පුළුල් ඉදිරි දර්ශනයක් සහ ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදනය කරන සංවිධානවල ගතිකතාවයන් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමෙනි.

ප්‍රතිපත්ති ක්‍රියාවලියේදී දැනුමේ කාර්යභාරය ප්‍රතිපත්ති විශ්ලේෂණයේ කේන්ද්‍රීය න්‍යායාත්මක ප්‍රහේලිකාවක් ලෙස පවතී. දැනුම පදනම් කරගත් ප්‍රතිපත්ති තේරීම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කළ හැක්කේ කෙසේද යන ගැටලුව විවාදයට තුඩු දී ඇති අතර ඒ සඳහා අවධානය යොමු කර ඇත. මෙම පාඨමාලාවේ සමස්ත පරමාර්ථය වන්නේ සමකාලීන ප්‍රතිපත්තිමය කරුණු විශ්ලේෂණය කිරීම සඳහා න්‍යාය සහ සාක්ෂි භාවිතා කළ හැකි ආකාරය ගවේෂණය කිරීමට අවස්ථාවක් ලබා දීමයි. රජයේ හා වෙනත් ආයතනවල වෘත්තිකයන් ලෙස වැඩ කිරීමට අපේක්ෂා කරන සිසුන්ට මෙම පාඨමාලාව විශේෂ වැදගත්කමක් උසුලන

අතර, එහිදී නව ප්‍රතිපත්තිමය ගැටලු විශ්ලේෂණය සඳහා අවශ්‍ය කරුණු එනම් උපදෙස් ලබා දීමට අවශ්‍ය දැනුම සහ උපදෙස් ලබා දෙනු ඇත.

පාඨමාලා ව්‍යුහය

ඒකක අංකය	කේතය	ඒකක නාමය	දේශන පැය	ඉගෙනුම් පැය	ඒකක ගණන
පළමු අර්ධ වාර්ෂිකය					
ඒකක 1	DPA 111	සූක්ෂම ආර්ථික විශ්ලේෂණය	45	150	3
ඒකක 2	DPA 112	සාර්ව ආර්ථික විශ්ලේෂණය	45	150	3
ඒකක 3	DPA 113	රාජ්‍ය ආර්ථික විද්‍යාව හා බදුකරණය	45	150	3
ඒකක 4	DPA 114	සංවර්ධන සැලසුම් හා ප්‍රත්පත්ති	45	150	3
ඒකක 5	DPA 115	පරිපාලනය හා යහපාලනය	45	150	3
ඒකක 6	DPA 116	ප්‍රත්පත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම	45	150	3
දෙවන අර්ධ වාර්ෂිකය					
ඒකක 7	DPA 121	සමාජ ප්‍රතිපත්ති සහ ප්‍රජා සංවර්ධන පුහුණුව	45	150	3
ඒකක 8	DPA 122	ප්‍රතිපත්ති ඇගයීම සහ ප්‍රතිඵල විශ්ලේෂණය	45	150	3
ඒකක 6ක් තෝරා ගැනීම මඟින්					
ඒකක 9	DPA 123	දේශීය රාජ්‍ය කළමනාකාරීත්වය සහ සහභාගීත්වය	45	150	3
ඒකක 10	DPA 124	මූල්‍ය නැඹුරුතා ප්‍රතිපත්ති සහ අවදානම් කළමණාකරණය	45	150	3
ඒකක 11	DPA 125	ව්‍යාපෘති පදනම් කරගත් ප්‍රතිපත්ති විශ්ලේෂණ වාර්තාව		300	6
			450	1500	30

12.8 ඉතිහාසය ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනැමීම: ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
අරමුණු:

1. පාසැල් පද්ධතිය තුළ හෝ අදාළ ක්ෂේත්‍රයේ ඉතිහාසය ඉගැන්වීමේ කටයුතුවල නියැලී සිටින ගුරුවරුන් ගේ විෂය දැනුම හා ආකල්ප වැඩිදියුණු කිරීම.
2. අදාළ විෂයානුබද්ධ ක්ෂේත්‍ර අධ්‍යයන තුළින් ප්‍රායෝගික පුහුණුව ලබාදීම.
3. ඉතිහාස විෂය ඉගැන්වීමේ හා ඇගයීම් කටයුතුවල යෙදෙන පිළිවෙත් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම.
4. ඉතිහාසය හා පුරාවිද්‍යා යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබාදීම.

ඉගෙනුම් ඵල:

මෙම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කිරීම තුළින් සිසුන් හට,

1. පාසැල් පද්ධතිය තුළ ඉතිහාසය ඉගැන්වීමේ පරමාර්ථයන්ට අනුකූලව පාසැල් සිසුන්ට අධ්‍යාපනය ලබාදීමට හැකිවීම.
2. විෂය දැනුම, පූර්ව පුහුණුව, පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම සහ ඇගයීම් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීම තුළින් උසස් මට්ටමින් ඉගැන්වීමේ කටයුතුවල නිරතවීමට හැකිවීම.
3. ඉතිහාසය හා සම්බන්ධ විෂයයන්හි ක්ෂේත්‍ර අධ්‍යයන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවීම.
4. අතීත මානව වර්ගයාගේ මූලාරම්භය, ස්වභාවය හා වර්ධනය පිළිබඳ අවබෝධ කර ගැනීම හා ඒ හා සම්බන්ධ සාමාජීය තත්ත්වයන් පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කර ගැනීමට හැකිවීම.

මට්ටම

SLQF - මට්ටම 3

NVQ - මට්ටම 5

හැඳින්වීම

ඉතිහාසය යනු මනුෂ්‍ය වර්ගයා ගේ ආරම්භයේ සිට වර්තමානය දක්වා ඔවුන්ගේ ක්‍රියාකාරකම් අධ්‍යයනය කරනු ලබන විෂයයකි. ඉගෙනීමේ පහසුව සලකා මෙම ක්‍රියාකාරකම් දේශපාලන, ආර්ථික, සමාජ, ආගමික හා සංස්කෘතික ආදී ක්ෂේත්‍ර ඔස්සේ සලකා බලනු ලැබේ. එකී ක්ෂේත්‍ර සියල්ල අධ්‍යයනය කරනු ලබන විට මනුෂ්‍ය සංස්කෘතිය හා සභ්‍යත්වය ගොඩනැඟී ඇති ආකාරය පරීක්ෂා කරනු ලබන බැවින් ඉතිහාසය යනු සියලු විෂයයන් අන්තර්ගත ගෘහයක් යැයි ඔර්ඩසකකස්බ නැමති පඬිවරයා විස්තර කර ඇත. ඒ අනුව ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් අතීතය දෙස වර්තමාන ඇසින් බලා අතීතයේ මතු වී තිබූ ගැටලු විසඳාගත් ආකාරය පිරික්සා එම අත්දැකීම් මඟින් වර්තමානය ගොඩනඟා ගෙන අනාගතය සාර්ථකව සැලසුම් කිරීමට පුලුවන. මේ නිසා ශිෂ්ට මානව සමාජයේ මෙතෙක් ගමන් මඟ අධ්‍යයනය කරමින් පුලුල් පරාසයක් කෙරෙහි දැනුම ව්‍යාප්ත කරන විෂයයක් වශයෙන් ඉතිහාසය විෂයයට වැදගත් ස්ථානයක් හිමිව තිබේ.

නිදහසෙන් පසු 1972 වර්ෂය වනතෙක් මෙරට පාසල් පද්ධතිය තුළ අ.පො.ස. (සා පෙළ) දක්වා ඉතිහාසය වෙනම විෂයයක් වශයෙන් උගන්වනු ලැබීය. එහෙත් 1972 වර්ෂයේ සිට දශක දෙකකට වැඩි කාලයක් ඉතිහාසය වෙනම විෂයයක් ලෙස ඉගැන්වීම අතහැර දමා තිබූ බැවින් වර්තමානයේ දිවයිනේ පාසැල් ගුරුවරු බොහෝමයක් ඉතිහාස විෂය හැදෑරූ අය නොවෙති. වර්ෂ 2005 සිට 06 වන වසර සිට 11 වන වසර දක්වා පාසල් පද්ධතිය තුළ ඉතිහාසය අනිවාර්ය විෂයයක් බවට පත්කොට ඇති බැවින් එම විෂය

ඉගැන්වීමේ කටයුතුවල නිරතවන ගුරු භවතුන්ට විෂය දැනුම වැඩකර ගැනීමට හා ඉගෙනුම් ක්‍රම ශිල්ප ගැන වඩා හොඳ දැනුමක් ලබාදීමේ අවශ්‍යතාවයක් මතුව තිබේ. මෙම ඉතිහාසය ඩිප්ලෝමා පාඨමාලාව එකී අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් සැලසුම් කර ඇත.

මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ අන්තර්ගතය පිළිබඳ සලකා බැලීමේ දී ලාංකේය ඉතිහාසය අධ්‍යයනය වෙනුවෙන් ශ්‍රී ලංකා ඉතිහාසයේ රජරට අවධිය, ශ්‍රී ලංකා ශිෂ්ටාචාරයේ නිරිතදිග රාජධානි අවධියේ සිට උඩරට රාජ්‍යය, 19 වන හා 20 වන සියවසේ ශ්‍රී ලංකාව යන විෂයය ඒකක වෙන් වී ඇති අතර ආසියානු, යුරෝපා හා ලෝක ඉතිහාසය වෙනුවෙන් පිළිවෙළින් ආසියාතික ඉතිහාසයේ ප්‍රධාන බලවේග, ඉන්දියානු ඉතිහාසය, හා යුරෝපා ඉතිහාසය මෙන්ම 20 වන සියවසේ නූතන ලෝකය යන විෂයය ඒකක වෙන්ව ඇති අතර මීට අමතරව ඉතිහාස අධ්‍යයනය සඳහා පුරාවිද්‍යාව යන විෂය ඒකකයත් ඉතිහාසය රචනය හැදෑරීමේ ශිල්පක්‍රම හා ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනය වෙනුවෙන් තවත් විෂයය ඒකකයක් ද වෙන්වී ඇත. මීට අමතරව ස්වාධීන පර්යේෂණ වාර්තාවක් පාඨමාලාව අවසානයේ ඉදිරිපත් කිරීම ද අනිවාර්ය අංගයකි. වසරක කාලයක් පුරා අර්ධ වාර්ෂික දෙකකින් යුක්තව පුරා පැය 450 ක කාලයක් සිංහල මාධ්‍යයෙන් මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන කටයුතු මෙහෙයවනු ලැබේ.

අර්ධ වාර්ෂික අවසාන පරීක්ෂණ හා අඛණ්ඩ ඇගයීම් මඟින් මෙම ඩිප්ලෝමාවේ ඇගයීම් කටයුතු සිදුකෙරේ.

පාඨමාලවේ ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
	පළමු අර්ධ වාර්ෂිකය			
DHIS 1110	ශ්‍රී ලංකා ඉතිහාසයේ රජරට අවධිය	45	150	3
DHIS 1120	ඉතිහාස අධ්‍යයනය සඳහා පුරාවිද්‍යාව	45	150	3
DHIS 1130	ශ්‍රී ලංකා ශිෂ්ටාචාරයේ නිරිතදිග අවධියේ සිට උඩරට රාජ්‍ය දක්වා	45	150	3
DHIS 1140	ඉන්දියානු ඉතිහාසය	45	150	3
DHIS 1150	ආසියාතික ඉතිහාසයේ ප්‍රධාන බලවේග	45	150	3
	දෙවන අර්ධ වාර්ෂිකය			
DHIS 1210	19 වන හා 20 වන සියවස්වල ශ්‍රී ලංකාව	45	150	3
DHIS 1220	යුරෝපා ඉතිහාසය	45	150	3
DHIS 1230	20 වන සියවසේ නූතන ලෝක ඉතිහාසය	45	150	3
DHIS 1240	ඉතිහාසය හැදෑරීමේ ශිල්පක්‍රම හා ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අධ්‍යයනය	45	150	3
DHIS 1990	ස්වාධීන අධ්‍යයනය	45	150	3
	එකතුව	450	1500	30

12.9 ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය - භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය
අරමුණු:

1. ග්‍රාමීය සංවර්ධනය සඳහා සම්බන්ධ වී සිටින මධ්‍යම මට්ටමේ සහ ඉදිරිපෙළ නිලධාරීන් පුහුණු කිරීම සහ ඒ සඳහා කැමැත්තක් දක්වන තරුණ ප්‍රජාවට පුළුල් පරාසයකින් දැනුම වර්ධනය කරගත හැකි පරිදි ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් න්‍යායාත්මක දැනුම සැපයීම.
2. සහභාගී වන්නන් සඳහා ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති රාමුව හඳුන්වා දීම.
3. ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්තීන්වල අනපේක්ෂිත බලපෑම් පිළිබඳ ව දැනුවත් කිරීම හා එවැනි බලපෑම්වලට එරෙහි ව සටන් කිරීම සඳහා සහභාගී වන්නන්ට විවිධ උපාය මාර්ග හඳුන්වා දීම.
4. ග්‍රාමීය සවංර්ධන කටයුතු සැලසුම් කිරීම හා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහභාගී වන්නන් පුහුණු කිරීමේ දී විශේෂයෙන් මහජනතාව/ප්‍රදේශ විශ්ලේෂණය, ග්‍රාමීය සැලසුම්, ව්‍යාපාර කළමනාකරණය වැනි අංශ පිළිබඳ සැලකිලිමත් වීම.

ඉගෙනුම් ඵල:

පාඨමාලාව සාර්ථක ව නිම කිරීමෙන් පසු ව සිසුනට,
1. ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ සංකල්ප, උපාය මාර්ග සහ භාවිතයන් හඳුනා ගැනීම
2. ග්‍රාමීය සංවර්ධනයේ දී තීරණාත්මක මානයන් සහ ක්‍රියාවලි පැහැදිලි කර ගැනීමට
3. ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන් ව්‍යාපෘති සහ වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ලබාගත් කුසලතා භාවිතා කිරීමට
4. ග්‍රාමීය ප්‍රදේශවල සමකාලීන ගැටලු විසඳීම සඳහා බහුවිධ ප්‍රවේශයක් ඒකාබද්ධ කිරීමට හැකියාව ලැබේ.

මට්ටම

SLQF - මට්ටම 03

NVQ - මට්ටම 05

හැඳින්වීම

නාගරික ස්වභාවයේ සමාජ, ආර්ථික පරිවර්තනයන් සිදු වූව ද ශ්‍රී ලංකාව තවමත් ප්‍රධාන වශයෙන් ග්‍රාමීය රටකි. එබැවින් ජාතික මෙන් ම කලාපීය සංවර්ධනය සඳහා උපාය මාර්ග සැකසීමේ දී ග්‍රාමීය අංශය අවධානය යොමු කළ යුතු කේන්ද්‍රස්ථානයක් වී තිබේ. රජය විශේෂයෙන් 1977න් පසු යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කරගත් ඍජු උත්සාහයට අමතර ව බොහෝ ආයතන පරිපාලන, දේශපාලනික අංශ ග්‍රාමීය සංවර්ධනය වේගවත් කිරීම සඳහා ස්ථාපිත කර ඇත. ජාතික සංවර්ධනය සඳහා නව යුගයක උදාව අද අප අත් විඳිමු. එමනිසා අලුතෙන් ඇති වූ ජාතික අවශ්‍යතාවය දිවයින පුරා වේගයෙන් සංවර්ධනය වන බව පැහැදිලි ය. එමනිසා ග්‍රාමීය සංවර්ධනය කාලයේ අවශ්‍යතාවයක් බවට පත් වී ඇති අතර විවිධ පාර්ශ්වකරුවන් එක්රැස් කිරීම සඳහා ගෙනඇති ඒකාබද්ධ ප්‍රයත්නයට එය ඉතා වැදගත් වේ. මෙම ප්‍රයත්නය තුළ බිම් මට්ටමේ කළමනාකරුවන්, ඉහළ මට්ටමේ නිලධාරීන්, විද්‍යාඥයින්, විද්‍යාර්ථයින් සහ ග්‍රාමීය ප්‍රජාව ප්‍රධානවේ.

මෙම ඒකාබද්ධ කර්තව්‍යයේදී විශ්වවිද්‍යාලවල කාර්යභාරය වැදගත් වනුයේ ඔවුන් සතුව ග්‍රාමීය සංවර්ධනයට අදාළ විද්‍යාත්මක හා න්‍යායාත්මක දැනුම ග්‍රාමීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධවන වෘත්තීමය-පාලකයින්ට සහ කළමනාකරුවන්ට බෙදාහැරීමට හැකියාව ඇති බැවින් ය.

ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමාව මගින් ග්‍රාමීය සමාජයේ පරිවර්තනයට දායකවන හා බලපාන සමාජ ආර්ථික සාධක පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදේ. මෙම පාඨමාලාවේ අන්තර්ගතය සැලසුම් කර ඇත්තේ ග්‍රාමීය සංවර්ධනයේ තීරණාත්මක මානයන් හා ක්‍රියාවලීන් පිළිබඳ ඒකාබද්ධ අවබෝධයක් සිසුන්ට ලබා දීම සඳහාය. එය අරමුණු කර ඇත්තේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, අධීක්ෂණය හා ඇගයීම් සම්බන්ධයෙන් කුසලතා ශිෂ්‍යයන්ට ලබාගැනීමට හැකිවන පරිදිය. තවද මෙම ඩිප්ලෝමාව මගින් ඉගනුම් කරුවන්ට පර්යේෂණ හා ව්‍යාපෘති වැඩසටහන් සම්බන්ධයෙන් මූලික දර්ශනයන් හඳුන්වා දෙනුලැබේ.

ව්‍යාපෘති මගින් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් අධ්‍යනයට අවස්ථාව ලැබෙන අතරම බිම් මට්ටමේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කුසලතාවයෙන් ඒකාබද්ධ වේ. මේ අනුව මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ සමස්ථ අරමුණු වනුයේ ග්‍රාමීය සංවර්ධන සංකල්පය පිළිබඳ අවබෝධයක් ලබාදීම, දැනට ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී ව සිටින ඉදිරිපෙළ නිලධාරීන්ට සහ එම ක්ෂේත්‍රයට සම්බන්ධවීමට කැමති ලාබාල නිලධාරීන්ට උපායමාර්ග හා භාවිතයන් පිළිබඳ අවබෝධයක් ලබාදීම වේ.

පාඨමාලා ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
පළමු අධ්‍යයන වාරය				
DRUD 1110	ග්‍රාමීය සංවර්ධනයේ න්‍යාත්මක දෘෂ්ටිකෝණය	45	150	3
DRUD 1120	ග්‍රාමීය ආර්ථිකය	45	150	3
DRUD 1130	ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය සඳහා සම්පත් පදනම	45	150	3
DRUD 1140	ග්‍රාමීය ගතික සමාජය	45	150	3
DRUD 1990	ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘති	45	150	3
	පළමු අධ්‍යයන වාරයේ සමස්තය	225	750	15
දෙවන අධ්‍යයන වාරය				
DRUD 1210	ග්‍රාමීය දිළිඳුකම	45	150	3
DRUD 1220	ග්‍රාමීය පාරිසරික ගැටලු	45	150	3
DRUD 1230	ආපදා කළමනාකරණය සහ ග්‍රාමීය සංවර්ධනය	45	150	3
DRUD 1240	ව්‍යාපෘති සැකසීම සහ කළමනාකරණය	45	150	3
DRUD 1990	ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතිය	45	150	3
	දෙවැනි අධ්‍යයන වාරයේ සමස්තය	225	750	15
	සමස්තය	450	1500	30

12.10 ලේඛකත්ව හා සන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය: සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

අරමුණු:

ලේඛකත්ව හා සන්නිවේදන කටයුතුවල නිරත වී සිටින එහෙත් ඒ පිළිබඳ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපනයක් ලැබීමට අවකාශ නොමැති අය වෙනුවෙන් විධිමත් දැනුමක් හා ප්‍රාමාණික අවබෝධයක් ලබාදීම මෙම පාඨමාලාවේ ප්‍රධානතම අරමුණයි. එමගින් නිර්මාණශීලී ලේඛන සහ සන්නිවේදන කුශලතා වර්ධනය කරවීමත් ජීවිත පරිඥානයෙන් යුතුව එහි නිපුණත්වය කරා ළඟාවීමේ ශක්‍යතාව ඇති කිරීමත් අපේක්ෂිතය.

ඉගෙනුම් ඵල:

ලේඛනයේ හා සන්නිවේදනයේ මුඛ්‍ය සංකල්ප හා මූලධර්ම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් ලබා තිබීම සහ ඒවායේ අන්තර්ගත සමාජ සංස්කෘතික, දේශපාලනික පර්යාවලෝකන කෙරෙහි අවධානය යොමු කරමින් දේශීය හා ගෝලීය සන්දර්භයෙහිලා විග්‍රහ කිරීමට, අර්ථකථනය කිරීමට හා සම්ප්‍රවේශනය කිරීමට හැකිවීම.

තාර්කික හා නිර්මාණශීලි චින්තනයත් ඵලදායි සන්නිවේදන කුශලතාත් වර්ධනය කරගැනීමෙන් ලේඛනයට හා සන්නිවේදනයට අදාළ දෘෂ්ටිවාදාත්මක විචල්‍යයන් ද සමාජ ආර්ථික සම්බන්ධතා ද විග්‍රහ කිරීමේ කළමනාකරණය කිරීමේ, ධනාත්මක ආකල්ප, සමාජ වගකීම් අවබෝධ කරගැනීමේ පෞද්ගලිකව හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ බුද්ධිමය ශක්‍යතාව වර්ධනය කර ගැනීම.

ලේඛනයට හා සන්නිවේදනයට අදාළ විශ්ලේෂණාත්මක, විග්‍රහාත්මක, නිර්මාණාත්මක කුශලතා මානව සන්දර්භයන්ගේ සිට නව තාක්ෂණික සන්දර්භයන් දක්වා විචාරාත්මකව වටහා ගැනීමටත් අනුවර්තන නම්‍යතාව ප්‍රායෝගිකව හඳුනාගැනීමටත් හැකිවීමෙන් වෘත්තීමය දක්ෂතාවෙන් අනූනව මනා ජීවන දැක්මකින් යුතුව අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගත හැකිවීම.

විෂයානුබද්ධ ශාස්ත්‍රීය සංකථන මගින් ලබා ගත් අවබෝධය, නිර්මාණශීලි සන්නිවේදනයෙන් හා සෞන්දර්යාත්මක රසඥතාවෙන් ජීවිතයට අන්තර්ග්‍රහණය කර ගැනීමත් එකී දැනුම සහ පුහුණුව යාවත්කාලීන කරගැනීමට හා නව දැනුම් ක්ෂේත්‍ර ගවේෂණය කරගැනීමට යොදා ගත හැකිවීම.

මට්ටම

SLQF – මට්ටම 3

NVQ – මට්ටම 3

හැඳින්වීම

1987 වසරේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය මගින් ආරම්භ කෙරුණු ලේඛකත්ව හා සන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාව වූකලි මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ආදිතම ඩිප්ලෝමා පාඨමාලාව යි. ලේඛකත්ව හා සන්නිවේදන කටයුතුවල නිරත වී සිටින එහෙත් ඒ පිළිබඳ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපනයක් ලැබීමට අවකාශ නොමැති අය වෙනුවෙන් මෙම පාඨමාලාව ක්‍රියාත්මක වේ. ලේඛන කලාව හා සන්නිවේදනයට අදාළ වන පරිදි භාෂාව, සාහිත්‍යය හා සන්නිවේදනය

යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ විෂයානුබද්ධ දැනුමක් මෙම පාඨමාලාව මගින් ලබා දේ. දැනට ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍ර ආවරණය කෙරෙමින් පැවැත්වෙන එකම පාඨමාලාව ද මෙය යි.

පාඨමාලාවේ ව්‍යුහය

කේතය	ඒකකයේ නම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
පළමු අධ්‍යයන වාරය				
DWC111	භාෂා පරිචය	30	100	2
DWC112	කලා විචාරය	30	100	2
DWC113	කාව්‍ය විධි	30	100	2
DWC114	නව ප්‍රබන්ධ විධි	30	100	2
DWC115	නාට්‍ය විධි	30	100	2
DWC116	ගීත විධි	30	100	2
DWC117	නිබන්ධ මාර්ගෝපදේශනය	45	150	3
DWC121	මුද්‍රිත මාධ්‍ය සන්නිවේදනය	30	100	2
DWC122	රූපවාහිනී මාධ්‍ය සන්නිවේදනය	30	100	2
DWC123	ගුවන්විදුලි මාධ්‍ය සන්නිවේදනය	30	100	2
DWC124	නව මාධ්‍ය	30	100	2
DWC125	දැන්වීම්කරණය හා ප්‍රචාරණය	30	100	2
DWC126	මහජන සම්බන්ධතා	30	100	2
DWC127	විස්තාරිත නිබන්ධය	45	150	3
		450	1500	30

12.11 අංගම්පොර සහතිකපත්‍ර පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය: මානව විද්‍යා අධ්‍යයනාංශය
අරමුණ:

වියැකෙමින් පවතින දේශීය අභිමානීයත්වය ඔප්නංවන්නා වූ පාරම්පරික හෙළ අංගම්පොර සටන් කලාවෙහි ජීව ශක්තිය සුරැකිනුවස් අනභිලාෂීව කටයුතු කිරීම හා අංගම්පොර සටන් නියමයන්ට අනුව නව පරම්පරාව සඳහා සටන්කලාව දායාද කිරීම. එමෙන්ම අංගම් සටන් කලාව පාසල් මට්ටමෙන් ඉගැන්වීම් කටයුතු සිදුකිරීම සඳහා සුදුසුකම් ඇති අංගම් ගුරුවරුන් පිරිසක් විශ්වවිද්‍යාලයෙහි ප්‍රමුඛත්වයෙන් ඇතිකිරීමට කටයුතු පිළියෙළ කිරීම.

ඉගෙනුම් ඵල:

වියැකෙමින් පවතින හෙළ අංගම් සටන් කලාවෙහි දේශීය අනන්‍යතාවය ඉස්මතු කිරීම හා අංගම් සටන් කලාව අනෙකුත් විදේශීය සටන් කලාවන් හා මිශ්‍ර වී විකෘති වීමට ඉඩනොදී සටන් ශිල්පය පිළිබඳ ඉපැරණි සිද්ධාන්තයන් ඒ අයුරින්ම සුරක්ෂිත කිරීමට කටයුතු කළ හැකි වීම.

අංගම් කලාවෙහි ඓතිහාසිකත්වය පිළිබඳව ලියැවී ඇති ඓතිහාසික ග්‍රන්ථ හා ලේඛන පිළිබඳව නව මානයන් ඔස්සේ ගවේෂණාත්මකව සොයා බැලීම මගින් විශ්වවිද්‍යාලයෙහි පර්යේෂණ ක්ෂේත්‍රයෙහි නව ප්‍රවේශයක් ඇති වීම.

කළහකාරී ගැටුම්කාරී තරුණ ප්‍රජාවෙහි චිත්තවේග පාලනය සඳහා අවශ්‍යය ශාරීරික අභ්‍යාස හා මානසික භාවනා ක්‍රම ප්‍රගුණ කිරීමට හැකිවීම.

මට්ටම

SLQF - මට්ටම 1

NVQ - මට්ටම 3

හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දේශීය අධ්‍යාපනය ඇති කිරීම හා නඟාසිටුවීමේ අරමුණින් ආරම්භ කරන ලද්දකි. බෞද්ධ දර්ශන සම්ප්‍රදාය, දේශීය භාෂාව හා කලා විෂය මාලාවනට මූලිකත්වය දෙමින් ආරම්භ කරන ලද පාඨමාලා රැසක් ක්‍රියාවට නංවන ලද විශ්වවිද්‍යාල අතර සුවිශේෂී ස්ථානයක් විද්‍යෝදය සරසවියට හිමි වේ. ඊට නිදර්ශනයක් නම් විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආරම්භයෙහි පැවති අධ්‍යයන විෂය මාලාවන් අතර ආයුර්වේදය ඇතුළු දේශීය වෙදකම, ජ්‍යෝතිෂය, සිංහල භාෂාව, බෞද්ධ විෂය මාලාවන්, දේශීය නර්තනය වැනි විෂය රැසක් පැවතීම යි. එහෙත් වර්තමාන විශ්වවිද්‍යාල පාඨමාලාවන්හි මුල්කාලීනව පැවති ආයුර්වේදය හා ජ්‍යෝතිෂය වැනි විෂයමාලාවන් ගිලිහී ගොස් ඇති අතර නැවතත් එම විෂය ක්ෂේත්‍රයෙහි පුනරුදයක් ඇති කිරීමේ අවශ්‍යතාව පවතියි.

කලාපර්ෂදය හා සංස්කෘතික මධ්‍යස්ථානය විසින් වර්තමානයෙහි බොහෝ සෙයින් කතාවට භාජනය වන දේශීය අංගම්පොර සටන් කලාව 2006 ජනවාරි 02 වන දින සිට අද දක්වා වසර දහතුනක පමණ කාලයක් පාඨමාලාවක් ලෙස පවත්වනු ලබයි. ආරම්භයේ සිට අද දක්වා විශාල සිසු පිරිසක් මෙම පාඨමාලාව

හදාරා ඇති අතර දැනුදු හදාරනු ලැබේ. විශ්වවිද්‍යාල පද්ධතියෙහි අංගම්පොර සටන් කලාව උගන්වන එක ම විශ්වවිද්‍යාලය ද ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යි.

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පැරැණි ම හා මුල් ම පීඨය වන මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය අධ්‍යයනාංශ දහයකට අධික ප්‍රමාණයක පැතිරුණු විෂයක්ෂේත්‍ර රැසක් පවතින දෙවන විශාල ම අධ්‍යයන පීඨය යි. එබැවින් දේශීය සංස්කෘතිය, කලාව හා ආගම සමග බැඳී පවත්නා අංගම්පොර සටන් කලාව ලාංකේය සිසු දරු දැරියනට දායාද කිරීමේ හැකියාව ඇති පීඨය ද මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය යි.

මානව විද්‍යා අධ්‍යයනාංශය මානව විද්‍යා විෂය පමණක් නොව දේශීය සංස්කෘතිය, ආගම, කලාවන් හා ඉතිහාසය පිළිබඳව ද අධ්‍යයනය සිදු කරයි. එබැවින් දේශීයත්වය හා බැඳුණු හෙළ අංගම්පොර සටන් කලාවෙහි අභිවෘද්ධිය සඳහා අංගම්පොර සටන් කලාව සහතිකපත්‍ර පාඨමාලාව ලෙස ආරම්භ කිරීමට අප අධ්‍යයනාංශය කටයුතු සලසා ඇත.
''අංගම්පොර සහතිකපත්‍ර පාඨමාලාව'' ලෙස මෙම අංගම්පොර පාඨමාලාව හැඳින්විය හැකි ය. මෙම පාඨමාලාව දේශීය අංගම්පොර සටන් කලාව පමණක් නොව අනෙකුත් මානව විද්‍යා විෂයයන් වන ජ්‍යොතිෂය, හෙළ වෙදකම, මන්ත්‍ර ශාස්ත්‍රය, දේශීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳව අවබෝධය ලබාදීමට සිදුකරනු ලබයි. එමෙන් ම ශ්‍රී ලාංකේය ඉතිහාසය, අතීත දේශපාලන හා නිදහස් සටන් පිළිබඳවත් ආගමික හා සංස්කෘතික කලාංගයන්හි අංගම් සටන්කලාවෙහි දායකත්වය පිළිබඳව මෙම පාඨමාලාවෙහි දී අවධානය යොමුකරනු ලැබේ.

ආධුනිකයින් සඳහා පවත්වනු ලබන මෙම අංගම්පොර සහතිකපත්‍ර පාඨමාලාව සටන් ශිල්පය හා එහි මූලික ස්වභාවය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා ඉවහල් වන පාඨමාලාවකි. වසර 12 අධික කාලයක් කලාපර්ෂදයේ ප්‍රධානත්වයෙන් සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් සංස්කෘතික කලාවක් ලෙස අංගම්පොර සටන් කලාව ද විශ්වවිද්‍යාල සිසුන් හා අධ්‍යයන අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන එකම විශ්විද්‍යාලයයි. මෙම පාඨමාලාවෙහි සියලුම දේශන විශ්වවිද්‍යාලය තුළ පැවැත්වෙන අතර ප්‍රායෝගික සටන් පුහුණුව විශ්වවිද්‍යාලයීය විදුදය අංගම් කලා මණ්ඩපයෙහි පැවැත්වීමට අපේක්ෂිතය. මෙම පාඨමාලාවෙහි දේශන පැය 75 ක් වන අතර ප්‍රායෝගික පුහුණු සඳහා පැය 120 ක් වේ. මෙම පාඨමාලාව න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.

පාඨමාලා ව්‍යුහය

විෂය අංකය	න්‍යායාත්මක දැනුම	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
අංගම්පොර විෂය නිර්දේශය				
CANG 1110	අංගම් සටන් කලාවේ බිහිවීම, විකාශනය හා සටන් ශිල්ප ක්‍රම, අංගම් සටන් ශිල්පයෙහි වෛද්‍ය ශාස්ත්‍ර ක්‍රම, නිල කලාව හා කායික මානසික වැදගත්කම සහ ලාංකික පැරණි ලිඛිත මූලාශ්‍රය තුළ සඳහන් වන සටන් කලාව හා නර්තනය, වාදනය හා චිත්‍ර කලා නිර්මාණයන්හි අංගම් කලාව නිරූපණය වී ඇති අයුරු	45	180	3
CANG 1120	අංගම්පොර සටන් කලාව හා නිදහස් සටන් අතර ඇති සම්බන්ධතාවය, අංගම් කලාව හා බුදුදහම අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය හා පූජා චාරිත්‍ර හා කලාත්මක නිර්මාණ සහ විදේශීය සටන් කලාවන් අතර දේශීය අංගම්පොර කලාවෙහි සුවිශේෂත්වය හා අංගම් සටන් කලාවෙහි වර්තමාන ස්වභාවය	30	120	2
	එකතුව	75	300	05
ප්‍රායෝගික පුහුණුව				
CANG 1130	අංගම්පොර, ඉලංගම්පොර සටන් පුහුණුව හා ව්‍යායාම, භාවනාව, මානසික අභිවෘද්ධිය හා මායා අංගම් කලාව සහ නිල කලාව,හෙළ වෙදකම හා අත්බෙහෙත් ක්‍රමය	120	300	8
CANG 1140	ස්වාධීන නිබන්ධනය හා ප්‍රායෝගික ශිෂ්‍ය ක්‍රියාකාරකම්	30	150	2
	ප්‍රායෝගික පැය	150	450	10
	එකතුව	225	750	15

12.12 සංචාරක ව්‍යාපාරය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

පිරිනමන අධ්‍යයනාංශය : මානව විද්‍යා අධ්‍යයනාංශය
අරමුණු

1. සංස්කෘතික සංචාරක ව්‍යාපාරය හා පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය පිළිබඳ දැනුම ගවේෂණය කිරීම.
2. සංචාරක මාර්ගෝපදේශකයින්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයට තිරසාර විසඳුම් ලබා දීම.

ඉගෙනුම් ඵල:

මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් ඩිප්ලෝමාධාරීන්ට

1. ගුණාත්මක සංචාරක මාර්ගෝපදේශකයෙකුගේ ලක්ෂණ හඳුනාගනිමින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරමින් වඩාත් ඵලදායී ලෙස සේවාවන් සැපයීමට හැකිවීම.
2. ස්පර්ශනීය හා අස්පර්ශනීය සංස්කෘතිකාංග පිළිබඳ විග්‍රහ කිරීමට හැකියාවක් තිබීම.
3. ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර භාවිත කරමින් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් පැහැදිලි කිරීමට හැකිවීම.
4. භූගෝලීය විවිධත්වය, මුහුදු වෙරළ, සාගර, වනජීවීන්, වෘක්ෂලතා යනාදිය පිළිබඳ දැනුම විදහා පෑමට හැකියාවක් ලැබීම.
5. සංස්කෘතික සංචාරක ව්‍යාපාරය, ග්‍රාමීය සංචාරක ව්‍යාපාරය, ආහාර පිළිබඳ සංචාරක ව්‍යාපාරය, කෘෂි සංචාරක ව්‍යාපාරය හා රූදෙස් සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සහ ජාතික ආදායම ඉහළ නැංවීම සඳහා දායක වීමට හැකිවීම.

මට්ටම

SLQF - මට්ටම 1

NVQ - මටටම 3

හැඳින්වීම

සංස්කෘතිය යනු රටක අනන්‍යතාවයයි. සංචාරක ව්‍යාපාරය විවිධ අරමුණු උදෙසා සිදු කළ ද, ලෝකයේ සංස්කෘතීන්හි විවිධත්වය දැකීමට බොහෝමයක් මිනිසුන් විදෙස් රටවලට යනු ලැබේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය මෙරට සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ මූලික අංගයක් බවට පත්ව ඇත. වර්ෂ 2017 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්තාවලට අනුව සංචාරකයන් මෙරටට පැමිණීමේ හේතු අතුරින් තෙවන ස්ථානය ගනු ලබන්නේ මෙරට සංස්කෘතියයි. එසේම ඓතිහාසික ස්ථාන නැරඹීම හතරවන ස්ථානය ගෙන ඇත. අවාසනාවකට මෙන්, 2019 අප්‍රේල් 21 වන ඉරිදා දින ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාර මෙන් ම වර්තමාන කොරෝනා වසංගත තත්ත්වය ද සංචාරක කර්මාන්තයේ විශාල පරිහානියකට ප්‍රධාන හේතුවක් වී තිබේ. එබැවින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම මෙරටට අභියෝගයක් වී තිබේ. ස්පර්ශනීය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් මත පදනම්ව සුදුසු යෝජනා ලබාදීමෙන් මෙම අභියෝගය ජය ගැනීමට මානව විද්‍යාවට හැකියාව ඇත. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය පිළිබඳ දැනුම ගවේෂණය කිරීම හරහා ගුණාත්මක සංචාරක මාර්ගෝපදේශකයන් නිර්මාණය කිරීම මඟින් සංස්කෘතික සංචාරක හා පාරිසරික සංචාරක

ව්‍යාපාරයන් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයට තිරසාර විසඳුම් ලබා දීමය. සංචාරක මාර්ගෝපදේශකයින්ගේ සංස්කෘතික දැනුම වැඩි දියුණු කිරීම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වඩාත් උචිත ක්‍රමයකි. එසේ ම සංචාරක ව්‍යාපාරය අපගේ ජාතික අනන්‍යතාවය ලොව පුරා ප්‍රචලිත කරන අතර විරැකියාව පිළිබඳ ගැටලුව විසඳීමේදී රැකියා වෙළඳපොළ වැඩි දියුණු කිරීම ද සිදු කරයි.

පාඨමාලා ව්‍යුහය

කේතය	විෂය	දේශන පැය	කාල්පනික පැය ගණන	ඒකක අගය
CTUR 1110	සංචාරක ව්‍යාපාරය හැඳින්වීම	30	100	2
CTUR 1120	ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රදේශ	45	150	3
CTUR 1130	ශ්‍රී ලංකාවේ සංස්කෘතික සංචාරක ව්‍යාපාරය	45	150	3
CTUR 1140	ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා ආගමික සංචාරක ව්‍යාපාරය	45	150	3
CTUR 1150	ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා සංචාරක ව්‍යාපාරය	45	150	3
CTUR 1160	ප්‍රායෝගික සැසිය (වාචික ඉදිරිපත් කිරීම/ක්ෂේත්‍ර චාරිකා)	15	50	1
	එකතුව	225	750	15

FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES

UNIVERSITY OF SRI JAYEWARDENEPURA
NUGEGODA, SRI LANKA

fhss.sjp.ac.lk/